© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය

## ශිල්පීය අදියර
## 2010 මාර්තු විභාගය

| | | | |
|---|---|---|---|
| විභාග දිනය | : 2010 මාර්තු 13 | පිටු ගණන | : 06 |
| විභාග වේලාව | : පෙ.ව. 9.30 - ප.ව. 12.30 | ප්‍රශ්න ගණන | : 06 |

අයදුම්කරුවන්ට උපදෙස්:
1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| **මූල්‍ය ගිණුම්කරණ මූලිකාංග** | **(FAF / 501)** |

---

**ප්‍රශ්න අංක 01 : *(ලකුණු 18)***

(a) ව්‍යාපාර සංවිධානයක යහපත් අභ්‍යන්තර පාලනයන්හි කොටසක් වශයෙන් පැවතිය යුතු ප්‍රමුඛ අංගයන් හතරක් ලැයිස්තුගත කර කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05)*

(b) පොත් තැබීම හා ගණකාධිකරණය (Accounting). මේවායේ කාර්යයන් එකිනෙක පැහැදිලි කරන අතර, ඒවා අතර ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් ගෙනහැර දක්වන්න. *(ලකුණු 04)*

(c) තිළිණ සහ මැතිව්ස්, ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කරති. 2008 වසරේ ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සම්බන්ධ විස්තර පහත සඳහන් වේ.

| | රු. |
|---|---|
| තොග 2008 ජනවාරි 01 | |
| අමුද්‍රව්‍ය | 102,000 |
| නොනිමි වැඩ (කම්හල් පිරිවැයට) | 29,000 |
| නිමි භාණ්ඩ | 81,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 903,000 |
| මිලදී ගැනුම් ප්‍රවාහන වියදම් | 23,000 |
| කම්හල් වේතන | 1,426,000 |
| ඡරිපනම් | 16,000 |
| ආලෝක දැල්වීම් සහ තාපය | 8,000 |
| පිරියත අලුත්වැඩියා | 9,000 |
| වැටුප් | 160,000 |
| යන්ත්‍ර සහ උපකරණ ක්ෂය ප්‍රතිපාදනය | 37,000 |
| 2008 දෙසැම්බර් 31 ට තොග | |
| අමුද්‍රව්‍ය | 121,000 |
| නොනිමි වැඩ (කම්හල් පිරිවැයට) | 32,000 |
| නිමි භාණ්ඩ | 107,000 |

(i) වරිපනම් වියදම් කම්හල් පරිශ්‍රයට 3/4 ක් අදාළ වන අතර ප්‍රධාන කාර්යාලයට 1/4 ක් අදාළයි.

(ii) ආලෝක කිරීම සහ තාප වියදම් කම්හල් සහ ප්‍රධාන කාර්යාලය අතර 4:1 අනුපාතයට වෙන්කළ යුතු ය.

(iii) වැටුප් වියදමෙන් හරි අඩක් කම්හල් නිලධාරී සහ අධීක්ෂකවරුන්ගේ වැටුප් වේ. රු. 2,600 ක් පිරිවැය වූ අමුද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඉවත ලූ අතර ඒවා තවදුරටත් කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැක.

නිෂ්පාදන ක්‍රියාවලිය නිමාකිරීමට පෙර සිදුකරන බැඳීම් ගාස්තු (Binding Charges) සඳහා ඒකකයක පිරිවැය රු.3 ක් විය. වර්ෂය තුළ ඒකක 2000 ක් නිපදවන ලදී. මෙම වියදම් ඍජු පිරිවැයක් හැටියට සැලකිය හැක.

නිෂ්පාදන කර්මාන්තශාලා පිරිවැය ගණන් බැලීමට, නිෂ්පාදන ගිණුමක් සකස්කර ඒකකයක පිරිවැය ගණන් බලන්න.
*(ලකුණු 09)*
*(මුළු ලකුණු 18)*

**<u>ප්‍රශ්න අංක 02 : *(ලකුණු 16)*</u>**

(a) සරසවි ට්‍රේඩර්ස් ව්‍යාපාරයේ 2009 ජුනි මස මුදල් සහ බැංකු ගනුදෙනු පරීක්ෂා කිරීමේ දී පහත දැක්වෙන තොරතුරු අනාවරණය විය.

(i) මුදල් පොත රු.16,500/- ක බැංකු අයිරාවක් දක්වයි.

(ii) බැංකු ප්‍රකාශය අනුව හරකරන ලද බැංකු ගාස්තු රු. 250/- කි. මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් කර ඇතිමුත් එකතු කරගැනීමට බැංකුවට නොයවන ලද චෙක්පත රු. 2,000/- කි.

(iii) මාසය තුළ නිකුත් කරන ලද එහෙත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු.8,750/- කි.

(iv) බැංකුවේ තැන්පත් කළ මුත් අගය නොලද චෙක්පත් වටිනාකම රු.1,050/- කි.

(v) 2009 මැයි මාසය තුළ වට්ටම් කරන ලද රු.3,000/- බිල්පත ජුනි මස 30 දින අගරු කර ඇත. මේ වෙනුවෙන් බැංකුව අයකළ සටහන් කිරීමේ ගාස්තු (Noting Charge) රු. 30/- කි.

(vi) ස්ථාවර නියෝග මත බැංකුව විසින් ජුනි 30 දින ගෙවන ලද ව්‍යාපාර අයිතිකරුගේ ජීවිත රක්ෂණ වාරික මුදල රු.1,800/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:
අවශ්‍යවන්නේ ඉහත තොරතුරු ආශ්‍රයෙන් මුදල් පොත ගැලපුම් කොට සහ බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කරන්න.
*(ලකුණු 08)*

(b) සරසවි ට්‍රේඩර්ස් 2009 ජුනි 30 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය කර ඇත්තේ අවිනිශ්චිත ගිණුමක රු. 1,600/- ක හර ශේෂයක් සමගිනි. මෙයට අදාළව පහත දැක්වෙන වැරදි එළිදරව් විය.

(i) රේණුකා ට්‍රේඩර්ස් වෙතින් රු. 27,500/- ක් වූ මිල දී ගැනුම් ඔවුන්ගේ ගිණුමට බැර කර ඇත්තේ රු. 25,700/- ක් ලෙසිනි.

(ii) විකුණුම් දෛනික පොත් එකතුව රු. 10,000/- කින් වැඩියෙන් දක්වා ඇත.

(iii) මිලදී ගැනුම් දෛනික පොතේ එක් පිටුවක එකතුව රු. 64,750/- ක ප්‍රමාණය ඊළඟ පිටුවට ගෙනයාමේ දී රු. 61,750/- න් වශයෙන් ලියා ලිබුණි.

(iv) සහීඩ් බ්‍රදර්ස් වෙළෙන්දන්ට රු. 15,500/- ක් අගය වූ ආපසු යැවුම්, ආපසු යැවුම් පොතේ සටහන් කර නැත. නමුත් එම ප්‍රමාණය සහීඩ් බ්‍රදර්ස් ගිණුමට නිසි අයුරින් හර කර ඇත.

(v) ව්‍යාපාර අයිතිකරු විසින් කළ රු. 1,500/- ක් පිරිවැය වූ භාණ්ඩ ගැනිලි, ගිණුම් පොත්වල සටහන් කර නැත.

අවශවන්නේ:
අවිනිශ්චිත ගිණුම නිෂ්කාශනය කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන්, පැහැදිලි කෙරෙන විස්තර සමග සඳහන් කරන්න.
*(ලකුණු 08)*
*(මුළු ලකුණු 16)*

**ප්‍රශ්න අංක 03 : *(ලකුණු 15)***

බී. වයිස් මහතා, පැකට් කරන ලද තේ සිල්ලරට විකුණන ව්‍යාපාරිකයෙකි. තමන් මිලට ගන්නා වෙළඳ ලකුණැති පැකට් තේ මෙන්ම තමන් විසින්ම මිශ්‍රණය කරන ලද තේ පැකට්ටු ද ඔහු සිල්ලරට විකුණයි.

විකුණුම් මත 30% ක දළ ලාභයක් උපයන පරිදි ඔහුගේ විකුණුම් මිල නියම කර ඇත.

පහත දැක්වෙන්නේ 2009 මාර්තු 31 දිනට ඔහුගේ සාරාංශගත ශේෂ පිරික්සුමයි.

| | රු. | | රු. | රු. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 324,000 | සාප්පු උපකරණ සවිකිරීම් | 150,000 | |
| | | අඩුකළා: ක්ෂය ප්‍රතිපාදන | 30,000 | 120,000 |
| බැංකු ණය | 30,000 | මෝටර් වාහන පිරිවැයට | 60,000 | |
| | | අඩුකළා: ක්ෂය ප්‍රතිපාදන | 15,000 | 45,000 |
| | | තොග පිරිවැයට | | 104,200 |
| වෙළඳ ණයහිමියෝ | 47,400 | වෙළඳ ණයගැතියෝ | | 62,600 |
| උපචිත වියදම් | 3,800 | ගෙවල් කුලී කලින් ගෙවන ලද | | 6,500 |
| | | බැංකු ශේෂය | | 60,000 |
| | | අත ඉතිරි මුදල් | | 6,900 |
| | 405,200 | | | 405,200 |

2009 මාර්තු 31 න් අවසන් වසර සඳහා නිසි ගිණුම් ක්‍රමයක් නොපැවැති වුවද වසරේ ගනුදෙනු පිළිබඳව වයිස් මහතා පහත සඳහන් තොරතුරු අනාවරණය කරයි.

i. මේ වසර අග අවසන් තොග පිරිවැය පෙර වසරේ අවසන් තොග පිරිවැයට වඩා රු. 40,000/- ක් වැඩියෙන් අගය කර ඇත.

ii. විකුණුම් එකතුව මෙම වසරේ රු. 1,526,000/- ක් වූ අතර, වසර තුළ ආපසු එවුම් රු. 35,000/- ක් විය. ඔහුට වසර තුළ දළ ලාභ අනුපාතය 30% සාමාන්‍යයකින් පවත්වාගත හැකි විය.

iii. වෙළඳ ණයහිමියෝ 2009 මාර්තු 31 දිනට රු. 63,900/- ක් වූ අතර, රු. 7,600/- ක වෙළඳ වට්ටම් ලැබී තිබුණි.

iv. එදිනට වෙළඳ ණයගැතියෝ රු. 56,200/- ක් වූ අතර, ඉන් බොල් ණය සඳහා 5% ප්‍රතිපාදනයක් කරනු ඇත. මුදල් වර්ෂය තුළ රු. 4,700/- බොල් ණය වශයෙන් කපාහැර ඇත.

v. වයිස් මහතා තොගවලින් රු. 6,000/- ක ගැනිලි සිදුකර ඇත. මේවා සැපයුම්කරුවන්ට කළ ගෙවීම්වලට අඩංගු ය. වෙනත් සටහන් කිසිවක් මේ වෙනුවෙන් කර නැත.

vi. සාප්පු වැටුප් වෙනුවෙන් රු. 158,400/- ක් වැයකර ඇත. වරිපනම් සඳහා රු. 4,600/- ක් සහ විදුලිය වෙනුවෙන් රු. 30,000/- කි. පරිශ්‍රයේ කොටසක් වෙනුවෙන් ගෙවල් කුලී රු. 4,800/- ක පෙර ගෙවීම් කර ඇත.

vii. විදුලිය බිල් වෙනුවෙන් රු. 3,100/- උපචිතව ඇත.

viii. වර්ෂය තුළ සාප්පුවේ සවිකිරීම් මිලට ගැනීම පිණිස රු. 20,000/- ක් ගෙවන ලදී. වසර අග සාප්පු උපකරණ සහ සවිකිරීම් පිරිවැය අගය මත 10% වශයෙන් ක්ෂය ප්‍රතිපාදන සැලැස්විය යුතු ය. එමෙන්ම මෝටර් වාහන (බෙදාහැරීමේ වෑන් රිය) මුල් පිරිවැය මත ක්ෂය ප්‍රතිපාදනය වසරකට 25% කි.

ix. 2009 මාර්තු 31 දින බැංකු ණය ගෙවා නිමකරන ලදී.

x. මුදල් වර්ෂය තුළ මුදලින් ගැනිලි රු. 90,000/- ක් විය.

**අවශ්‍යවන්නේ:**

(a) පහත ගිණුම් සකස් කරන්න.

(i) එකතු මුදල් ගිණුම (ii) එකතු ණයගැති ගිණුම (iii) එකතු ණයහිමි ගිණුම

***(ලකුණු 08)***

(b) 2009 මාර්තු 31 න් අවසන් වසර සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුමක් සකස් කරන්න. ***(ලකුණු 07)***

***(මුළු ලකුණු 15)***

**ප්‍රශ්න අංක 04 : *(ලකුණු 15)***

මැණික්ෆාම් සමාජයේ භාණ්ඩාගාරික, තම සමාජයේ 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන ලැබීම් සහ ගෙවීම් ඉදිරිපත් කර ඇත.

**ලැබීම් සහ ගෙවීම් ගිණුම**

| <u>ලැබීම්</u> | රු. | <u>ගෙවීම්</u> | රු. |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | 2,350 | ගෙවල් කුලී සහ වරිපණම් | 5,600 |
| සාමාජික දායක මුදල් | 4,530 | උපකරණ | 2,000 |
| ප්‍රදානයන් | 1,000 | විදුලි බිල්පත් | 2,600 |
| උද්‍යාන සාදයේ ශුද්ධ ලැබීම් | 1,300 | පවිත්‍ර කිරීමේ සහ විවිධ | 650 |
| මත්පැන්හලේ අලෙවිය | 40,580 | බීමහලෙ සහායකගේ වේතන | 7,500 |
| පිටස්තරයට සැපයීම් සඳහා ලැබීම් | 2,500 | භූරකරුගේ වේතන | 2,500 |
| ආයෝජන ආදායම | 500 | බීමහලේ සේවකගේ වේතන | 1,200 |
| | | පරිශ්‍ර අලුත්වැඩිය | 870 |
| | | මත්පැන්හල සඳහා මිලට ගැනුම් | 24,680 |
| | | මුද්‍රණ ගාස්තු හා ලිපිද්‍රව්‍ය | 1,200 |
| | | අවසන් ශේෂය | 3,960 |
| | 52,760 | | 52,760 |

පහත දැක්වෙන තොරතුරු අදාළ වේ.

(i) 2008 ජනවාරි 01 වන දින සමුච්චිත අරමුදලේ ශේෂය රු. 25,000/- ක් වූ අතර, අලුත්වැඩියා අරමුදලේ ශේෂය රු. 8,000/- කි.

(ii) මැණික්ෆාම් සමාජයට රු. 10,000/- ක ආයෝජන ඇත.

(iii) මත්පැන්හලේ තොග ජනවාරි 01 වන දින අගය රු. 7,500/- ක් වූ අතර, 2008 දෙසැම්බර් 31 දින තොගය රු. 6,830/- ක් විය.

(iv) ජනවාරි 01 වන දින ලී බඩු සහ උපකරණවල ක්ෂය කළ වටිනාකම රු. 8,000/- ක් වූ අතර, ගෘහ භාණ්ඩවල ක්ෂය කරන ලද වටිනාකම රු. 2,500/- ක් විය.

(v) 2008 ලද සාමාජික මුදල්වලින් රු. 100/- ක් 2009 වසර්ෂයට අදාළයි. 2008 වෙනුවෙන් සාමාජික මුදල් රු. 170/- ක් හිඟ හිට ඇත.

(vi) ඈසැම්බර් 31 දිනට 2009 වර්ෂය වෙනුවෙන් රු. 350/- ක් පළාත් පාලන ආයතනයට වරිපනම් වශයෙන් කරන ලද පෙර ගෙවීම් ය.

(vii) මැණික්ෆාම් සමාජය මිලට ගන්නා උපකරණ සඳහා මිලට ගත් වසරේ දී ක්ෂය ප්‍රතිපාදනය කරනු නොලැබේ.

(viii) පිටස්තරයට මත්පැන් සැපයීම මත්පැන්හලට ආදායමකි.

(ix) මත්පැන්හල විකුණුම් වෙනුවෙන් වෙනම ගිණුම් සකස් කළ යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මත්පැන්හලේ වෙළඳ ගිණුම *(ලකුණු 03)*

(b) මැණික්ෆාම් සමාජයේ ආදායම් සහ වියදම් ගිණුම *(ලකුණු 05)*

(c) වාර්ෂික මහ සභා රැස්වීම් සාමාජිකයන් වෙත ඉදිරිපත් කිරීම සඳහා ශේෂ පත්‍රය. *(ලකුණු 07)*

*(මුළු ලකුණු 15)*

**ප්‍රශ්න අංක 05 : *(ලකුණු 20)***

පහත දැක්වෙන්නේ සීමිත සිම්ටෙක් (පුද්) සමාගම වෙළඳුන්ගේ 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමයි.

**ශේෂ පිරික්සුම**

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| රු. 10/- සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 500,000 |
| 9% රු. 10/- වරණීය කොටස් ප්‍රාග්ධනය | | 100,000 |
| කොටස් අධිමිල | | 35,000 |
| පොදු සංචිතය | | 100,000 |
| ලාභාලාභ ගිණුම - ජනවාරි 01 දිනට | | 137,000 |
| 12% ණයකර | | 50,000 |
| කීර්තිනාමය | 100,000 | |
| සින්නරකර දේපල | 150,000 | |
| යන්ත්‍ර සහ උපකරණ | 200,000 | |
| ලී බඩු සහ සවිකිරීම් | 100,000 | |
| මෝටර් වාහන | 200,000 | |
| ක්ෂය ප්‍රතිපාදන | | |
| ගොඩනැගිලි | | 50,000 |
| යන්ත්‍ර සහ උපකරණ | | 100,000 |
| ලී බඩු සහ සවිකිරීම් | | 14,500 |
| මෝටර් වාහන | | 50,000 |
| බොල් ණය ප්‍රතිපාදන | | 10,450 |
| තොග | 482,250 | |
| වෙළඳ ණයගැතියෝ | 280,000 | |
| වෙළඳ ණයහිමියෝ | | 190,550 |
| අත ඉතිරි මුදල් | 3,650 | |
| බැංකු අයිරාව | | 35,450 |
| මිලට ගැනුම් | 1,160,500 | |
| විකුණුම් | | 1,610,500 |
| වැටුප් සහ වේතන | 62,750 | |
| වරිපනම්, කුලී සහ රක්ෂණ | 46,100 | |
| පරිපාලන වියදම් | 19,450 | |
| විදුලිය සහ තාපය | 38,450 | |
| වෙළඳ දැන්වීම | 56,300 | |
| බොල් ණය | 17,050 | |
| ඇසුරුම් ද්‍රව්‍ය | 28,400 | |
| පිටතට ප්‍රවාහන ගාස්තු | 32,050 | |
| බැංකු පොලී | 3,500 | |
| ණයකර පොලී | 3,000 | |
| | 2,983,450 | 2,983,450 |

**පහත දැක්වෙන තොරතුරු ද අදාළ ය.**

(i) 2008.12.31 දිනට තොග වටිනාකම රු. 568,250/- ක් විය.

(ii) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 10/- සාමාන්‍ය කොටස් 50,000 ක් සහ රු. 10/- ක්වූ 9% වරණීය කොටස් 10,000 කි.

(iii) මුළු ණයගැති මුදලින් 5% බොල් ණය ප්‍රතිපාදන ලෙස පැවැත්විය යුතු ය.

(iv) වරිපනම් රු. 4,250/- ක් සහ රක්ෂණ රු. 1,550/- ක් පෙර ගෙවීම් ය.

(v) යන්ත්‍ර සහ උපකරණ වාර්ෂිකව 12 ½% , ගෘහභාණ්ඩ හා සවිකිරීම් වාර්ෂිකව 10 % හා මෝටර් වාහන වාර්ෂිකව 25% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කළ යුත්තේ ලියාහරින ලද අගය මත වේ.

(vi) විගණන ගාස්තු රු. 1,250/- ක් ප්‍රතිපාදනය කළ යුතු ය.

(vii) අධ්‍යක්ෂවරුන් විසින් (I) ශුද්ධ ලාභයෙන් රු. 50,000/- ක් පොදු සංචිතයට බැර කිරීමටත්, (II) වරණීය ලාභාංශ සහ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් 10% ක ලාභාංශයක් ගෙවීමටත් යෝජනා කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම ***(ලකුණු 08)***

(b) ලාභාලාභ විසර්ජන ගිණුම ***(ලකුණු 03)***

(c) 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය ***(ලකුණු 09)***

***(මුළු ලකුණු 20)***

**ප්‍රශ්න අංක 06 : *(ලකුණු 16)***

පුබුදු සහ දිනිඳු තමන් අතරේ ලාභාලාභ පිළිවෙලින් 5/3 සහ 5/2 වශයෙන් බෙදාගනිමින් ව්‍යාපාර කරයි. හවුල්කාර ව්‍යාපාරයේ ඔවුන්ගේ අයිතීන් සහ 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගනුදෙනු ශේෂයන් ද පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයෙන් | | |
| පුබුදු | | 30,000 |
| දිනිඳු | | 20,000 |
| පුබුදු - ණය ගිණුම | | 5,000 |
| ජංගම ගිණුම | | |
| පුබුදු | | 536 |
| දිනිඳු | 100 | |
| ගැනිලි | | |
| පුබුදු | 8,000 | |
| දිනිඳු | 4,000 | |
| ජනවාරි 01 තොග පිරිවැයට | 4,175 | |
| බෙදාහැරීමේ වියදම් | 817 | |
| විකුණුම් | | 65,000 |
| ණයහිමියෝ | | 6,580 |
| ණයගැතියෝ | 8,760 | |
| කර්මාන්තශාලාවෙන් මිලට ගැනුම් | 42,608 | |
| සින්නක්කර ගොඩනැගිලි පිරිවැයට | 22,100 | |
| කීර්තිනාමය සහ පේටන් බලපත්‍ර, පිරිවැයට | 2,000 | |
| යන්ත්‍ර සහ උපකරණ පිරිවැයට | 41,170 | |
| යන්ත්‍ර සහ උපකරණ ක්ෂය ප්‍රතිපාදන | | 19,408 |
| පරිපාලන වියදම් | 6,129 | |
| විකිණීමේ වියදම් | 4,740 | |
| කපාහරින ලද බොල් ණය | 425 | |
| බැංකුවේ මුදල් ශේෂ | 1,500 | |
| | 146,524 | 146,524 |

හවුල්කාර ගිවිසුමේ අඩංගු ප්‍රතිපාදනඃ

(i) රු. 1,400/- ක් පුබුදුටත්, රු. 1,100/- ක් දිනිඳුටත් මාසිකව වැටුප් වශයෙන් ගෙවීමට.

(ii) හවුල්කරුවන්ගේ ස්ථාවර ප්‍රාග්ධනය මත වාර්ෂික 6% ක පොලී ගෙවීමට.

(iii) හවුල්කරුවන් දෙන ණය මුදල් මත 7% වාර්ෂික පොලියක් ගෙවීමට

පහත දැක්වෙන තොරතුරු අදාළ ය.
2008 දෙසැම්බර් 31 දිනට තොග රු. 4,090/- ක් පිරිවැය විය.
ගෙවල් කුලී පෙර ගෙවීම් 200/- ක් වූ අතර වරිපනම් රු. 271/- ක් උපචිත විය.

**ඔබ විසින් කළ යුතු දෑඃ**

(a) 2008 වසරට වෙළඳ හා ලාභාලාභ ගිණුමක් සකස් කිරීම *(ලකුණු 05)*
(b) ලාභාලාභ විසර්ජන ගිණුම *(ලකුණු 05)*
(c) ශවුල්කරුවන්ගේ ජංගම ගිණුම *(ලකුණු 06)*
*(මුළු ලකුණු 06)*

ප්‍රශ්න පත්‍රය අවසානයි